# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2023.01.23 |

## ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2022 දෙසැම්බර් මාසයේ දී තවදුරටත් පහළ ගියේය

| උද්ධමනය | 2022 නොවැම්බර් | 2022 දෙසැම්බර් |
|---|---|---|
| **මතුපිට** | | |
| දර්ශක අගය | 256.3 | 256.3 |
| මාසික වෙනස (%) | -0.2 | 0.0 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 65.0 | 59.2 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 46.7 | 50.4 |
| **මූලික** | | |
| දර්ශක අගය | 244.9 | 245.2 |
| මාසික වෙනස (%) | 0.1 | 0.1 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 60.1 | 57.5 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 40.0 | 43.9 |

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 65.0හි සිට 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට 59.2 දක්වා තවදුරටත් පහළ ගියේය. එම ප්‍රවණතාවම අනුගමනය කරමින්, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 69.8හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 59.3 දක්වා තවදුරටත් පහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 60.4හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 59.0 දක්වා පහළ ගියේය.

ජා.පා.මි. දර්ශකයේ මාසික වෙනස, 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 0.01ක් ලෙස වාර්තා විය. මේ සඳහා, ආහාර කාණ්ඩයේ අයිතමවල මිලෙහි සිදු වූ සියයට 0.20ක මාසික පහළ යෑම, ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල සිදු වූ සියයට 0.21ක මිල ඉහළ යෑම මගින් මුළුමණින්ම පාහේ තුලනය වීම හේතුවිය. ඒ අනුව, ආහාර කාණ්ඩය තුළ, ලොකු ළූණු, කරවල, සීනි, එළවළු, සහ සහල් මිල ගණන් පහළ ගියේය. කෙසේ වුවද, 2022 දෙසැම්බර් මාසය තුළ දී පොල්, කිරිපිටි, සහ පලතුරු මිල ගණන් ඉහළ යෑමක් වාර්තා විය. මේ අතර, 2022 දෙසැම්බර් මාසයේ දී ආහාර නොවන කාණ්ඩය තුළ, රෙදිපිළි හා පාවහන්, සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩයන්හි මිල ගණන් ඉහළ ගියේය.

තවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 46.7හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 50.4 දක්වා ඉහළ ගියේය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 60.1හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 57.5 දක්වා පහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 40.0හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 43.9 දක්වා ඉහළ ගියේය.

**ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (ප්‍රතිශත වෙනස)**




**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් ශ්‍රී ලංකාවේ සියලුම පළාත්වල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

### උප කාණ්ඩ අනුව ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) | ජා..පා.මි.ද. | ජා..පා.මි.ද. (මූලික) |
| 2021 | දෙසැම්බර් | 161.0 | 155.7 | 3.7 | 1.8 | 14.0 | 10.8 | 7.0 | 5.5 |
| 2022 | ජනවාරි | 166.0 | 159.2 | 3.1 | 2.2 | 16.8 | 12.9 | 8.1 | 6.2 |
| | පෙබරවාරි | 167.8 | 161.2 | 1.1 | 1.3 | 17.5 | 14.1 | 9.3 | 7.1 |
| | මාර්තු | 172.7 | 166.3 | 2.9 | 3.2 | 21.5 | 17.3 | 10.6 | 8.2 |
| | අප්‍රේල් | 190.3 | 182.3 | 10.2 | 9.6 | 33.8 | 27.9 | 13.0 | 10.2 |
| | මැයි | 208.7 | 197.9 | 9.7 | 8.6 | 45.3 | 37.7 | 16.3 | 13.0 |
| | ජුනි | 231.5 | 215.9 | 10.9 | 9.1 | 58.9 | 49.3 | 20.8 | 16.8 |
| | ජුලි | 244.4 | 229.0 | 5.6 | 6.1 | 66.7 | 57.3 | 25.9 | 21.3 |
| | අගෝස්තු | 250.4 | 235.1 | 2.5 | 2.7 | 70.2 | 60.5 | 31.3 | 26.0 |
| | සැප්තැම්බර් | 256.2 | 241.5 | 2.3 | 2.7 | 73.7 | 64.1 | 36.9 | 31.0 |
| | ඔක්තෝබර් | 256.9 | 244.6 | 0.3 | 1.3 | 70.6 | 62.4 | 42.2 | 35.7 |
| | නොවැම්බර් | 256.3 | 244.9 | -0.2 | 0.1 | 65.0 | 60.1 | 46.7 | 40.0 |
| | දෙසැම්බර් | 256.3 | 245.2 | 0.0 | 0.1 | 59.2 | 57.5 | 50.4 | 43.9 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව